00076

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන)ගෞරව උපාධි වැඩසටහන

6 වන මට්ටම 2020/2021

අවසාන පරීක්ෂණය - 2021

පුනරුත්ථාපනය හා ප්‍රජා මූලික පුනරුත්ථාපනය - SNU6225/ESU4125

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2021.05.08 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

<u>1 වන කොටස</u>

01. 'පුනරුත්ථාපනය' යන පදය ඔබේ වචනයෙන් නිර්වචනය කරන්න.

02. වෛද්‍යමය ආකෘතියේ සහ සමාජ ආකෘතියේ දුබලතා සහිත ළමයෙක් සංජානනය කරන්නේ කෙසේදැයි වෙන් වෙන් වශයෙන් කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ලෝක සෞඛ්‍ය සංවිධානයේ (1980) නිර්වචනයට අනුව 'ඌනතාවය' නිර්වචනය කරන්න.

04. ප්‍රජාමූලික පුනරුත්ථාපන වැඩසටහනේ සංරචක පහ (05) නම් කරන්න.

05. ප්‍රජාමූලික පුනරුත්ථාපනය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය ඉදිරිපත්කළ නිර්වචනය ලියා දක්වන්න.

06. ප්‍රජාමූලික පුනරුත්ථාපන වැඩසටහනේ ප්‍රාථමික අරමුණ කුමක් ද?

07. දුබලතා සහිත ළමයින්ගේ සංවර්ධනය කෙරෙහි අනුකම්පාවේ ප්‍රතිවිපාක මොනවා ද?

08. දුබලතා සහිත පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීමේ දී ප්‍රජාව සතු භූමිකා පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09\. (i) දුබලතා සහිත පුද්ගලයන්ගේ සංවිධාන යනු මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 08)

(ii) දුබලතා සහිත පුද්ගලයන් පුනරුත්ථාපන ක්‍රියාවලියේ දී පවුලේ හා සමාජයේ කාර්යභාරය වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

10\. (i) ක්‍රියාකාරී දුබලතා සහ සෞඛ්‍ය පිළිබඳ ජාත්‍යන්තර වර්ගීකරණයට අනුව දුබලතාවය යන සංකල්පය පිළිබඳ වර්ගීකරණ සඳහන් කරන්න. (ලකුණු 08)

(ii) ඉහත වර්ගීකරණයෙන් එක් වර්ගයක් පමණක් තෝරාගෙන දුබලතා සහිත පුද්ගලයෙකුගේ සෞඛ්‍යමය සන්දර්භයේ සිට සුදුසු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

11\. (i) උත්ථාපනය හා පුනරුත්ථාපනය අතර ඇති වෙනස සුදුසු උදාහරණ තුනක් (03) ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) දුබලතා සහිත පුද්ගලයින් සඳහා ගම පදනම් කරගත් ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩ සටහනක් ආරම්භ කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර විස්තරාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 12)

12\. (i) දුබලතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ (2007) අභිප්‍රාය සඳහන් කරන්න. (ලකුණු 08)

(ii) (a) ඉහත ප්‍රඥප්තියේ 24 වන වගන්තියට අනුව රජයේ පාර්ශ්වයන් විසින් දුබලතා සහිත පුද්ගලයින්ගේ අධ්‍යාපනය සහතික කළයුතු අකාරය විස්තර කරන්න. (ලකුණු 06)

(b) ඉහත ප්‍රඥප්තියේ 26 වන වගන්තියට අනුව රජයේ පාර්ශ්වයන් විසින් දුබලතා සහිත පුද්ගලයන්ගේ උත්ථාපනය හා පුනරුත්ථාපනය සහතික කළයුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

13\. (i) දුබලතා සහිත දරුවන් පුනරුත්ථාපනය කිරීමේ ක්‍රියාවලියේ දී පාසලේ කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(ii) අන්තර්කරණ පන්තිකාමරයක ගුරුවරයෙකු ලෙස ඔබගේ පන්තිකාමරයේ දුබලතා සහිත දරුවකු පුනරුත්ථාපනය කිරීමේ ක්‍රියාවලියේ දී පන්තියේ අන් දරුවන්ගේ සහය ලබා ගැනීමට ඔබ කටයුතු කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 12)

14\. (i) ශ්‍රී ලංකා රජය විසින් ස්ථාපිත දුබලතා සහිත පුද්ගලයන්ගේ පුනරුත්ථාපන ක්‍රියාවලියෙහි ඇති දුබලතා හා ප්‍රබලතා පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) දේශපාලන සහභාගිත්වය දුබලතා සහිත පුද්ගලයිනගේ පුනරුත්ථාපනය කෙරෙහි බලපාන්නේ කෙසේදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 12)

හිමිකම් ඇවිරිණි.